සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.31 / 0830 - 1030

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** සන්නිවේදක සහ ග්‍රාහක භූමිකා හුවමාරුව සන්නිවේදන ආකෘතියක් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත්තේ,
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(2) ශ්‍රාම් හා ඔස්ගුඩ් ය.
(3) ෂැනන් හා වීවර් ය.
(4) ඩේවිඩ් කේ. බර්ලෝ ය.
(5) එඩ්වඩ් සැපීර් ය.

**2.** නිදහස් මතවාදයට විරුද්ධව කටයුතු කළ පුද්ගලයකු ලෙස සැලකෙන්නේ,
(1) ස්ටුවට් මිල් ය.
(2) ජෝන් ලොක් ය.
(3) තෝමස් ජෙෆර්සන් ය.
(4) ජෝසප් ගොබෙල්ස් ය.
(5) ජෝන් අර්ස්කින් ය.

**3.** සන්නිවේදකයාගේ සිතුවිලි, පණිවිඩ බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,
(1) භාෂණය ලෙසයි.
(2) සංජානනය ලෙසයි.
(3) පරිකල්පනය ලෙසයි.
(4) සම්ප්‍රේෂණය ලෙසයි.
(5) ආකේතිකරණය ලෙසයි.

**4.** සන්නිවේදනයේදී සන්නිවේදකයා අපේක්ෂා කළ ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම වැදගත් වේ. මේ බව ඉස්මතු කර දක්වා ඇත්තේ,
(1) ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියෙනි.
(2) හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ නිර්වචනයෙනි.
(3) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතියෙනි.
(4) විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනයෙනි.
(5) ෂැනන් හා වීවර් ආකෘතියෙනි.

**5.** යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදන විධික්‍රමයක් වන්නේ,
(1) දුරකථනයයි.
(2) ශබ්ද විකාශන යන්ත්‍රයයි.
(3) ගුවන් විදුලි යන්ත්‍රයයි.
(4) පුරවැසි මාධ්‍යයයි.
(5) මයික්‍රෆෝනයයි.

**6.** සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය හඳුන්වා දෙන ලද වැදගත්ම අංගය වන්නේ,
(1) මූලාශ්‍රයයි.
(2) බලපෑමයි.
(3) ඝෝෂාවයි.
(4) ප්‍රතිපෝෂණයයි.
(5) ග්‍රාහකයායි.

**7.** ඩේවිඩ්. කේ. බර්ලෝගේ ආකෘතියට අනුව මූලාශ්‍රය ලෙස හැඳින්වෙන්නේ,
(1) සිද්ධියයි.
(2) අවස්ථාවයි.
(3) සන්නිවේදකයායි.
(4) නිවේදකයායි.
(5) සංකල්පයයි.

**8.** ජනසන්නිවේදනය සෙසු සන්නිවේදන වර්ග අතුරෙන් වෙනස් වීමට හේතු වන්නේ එකී ක්‍රියාවලියේ දෘශ්‍යමාන
(1) කර්මාන්තමය ස්වභාවයයි.
(2) සමජාතීය ග්‍රාහක ක්ෂේත්‍රයයි.
(3) සන්නිවේදක-ග්‍රාහක සම්පතාවයි.
(4) සක්‍රිය ප්‍රතිපෝෂණයයි.
(5) අසන්තතික බවයි.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** ස්ව සංකල්පය, ස්වයං සම්භාවනාව, ස්වයං ප්‍රතිරූපය (self image) යන අදහස් වඩාත් සම්බන්ධ වන්නේ,
(1) පුද්ගලාන්තර සන්නිවේදනයට ය. (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට ය.
(3) නිර්වාචික සන්නිවේදනයට ය. (4) උත්තේජන ප්‍රතිචාර න්‍යායට ය.
(5) දෙපියවර සංකල්පයට ය.

**10.** "ජාතික සංවර්ධනය යනු ප්‍රධාන වශයෙන් ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය හා සදාචාර සංවර්ධනය යන කොටස්වලින් පරිපූර්ණ වූ සංවර්ධනයයි." මේ අදහස ප්‍රකාශ කරන ලද්දේ,
(1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩඩ්ලි සියර්ස් විසිනි.
(3) විමල් දිසානායක විසිනි. (4) එවරට් එම්. රොජර්ස් විසිනි.
(5) මහත්මා ගාන්ධි විසිනි.

**11.** රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට නිර්දේශ කරන ලද්දේ,
(1) වෛද්‍යනාදන් කොමිසමයි. (2) සෝල්බරි කොමිසමයි.
(3) වීරසූරිය කොමිසමයි. (4) තොරතුරු කොමිසමයි.
(5) හුළුගල්ල කොමිසමයි.

**12.** ශ්‍රාව්‍ය ගවේෂණයේදී භාවිත කරන ශිල්ප විධියක් වන්නේ,
(1) සහානුභූතියයි. (2) සංස්ලේෂණයයි. (3) සමාජානුයෝජනයයි.
(4) සංකේන්ද්‍රනයයි. (5) සමජාතීකරණයයි. (Homogenization)

**13.** දෙපියවර සන්නිවේදන ආකෘතියට අනුව ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන්නේ,
(1) මාධ්‍යවේදීන් ය. (2) දොරටුපාලකයන් ය.
(3) බලපෑම් කණ්ඩායම් ය. (4) ජනමත නායකයන් ය.
(5) මාධ්‍ය හිමිකාරයන් ය.

**14.** ජනමාධ්‍ය මගින් කිසියම් සංසිද්ධියක් පිළිබඳ විෂයමූලික මෙන්ම විශ්ලේෂණාත්මක විග්‍රහයක් ලබා දීම සම්බන්ධයෙන් තීරණාත්මක සාධකය වන්නේ,
(1) වාර්තාකරණයයි. (2) දොරටුපාලනයයි. (3) හිමිකාරිත්වයයි.
(4) විචාරයයි. (5) සංස්කරණයයි.

**15.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මැතිවරණ ව්‍යාපාරවලදී ජනතා න්‍යාය පත්‍රය සකස් කරන්නේ ජනමාධ්‍යයයි.
(2) සහවේදනය මනාව තේරුම් ගැනීමට නම් අනුකම්පාව හා සැසඳිය යුතු ය.
(3) වාචික සන්නිවේදනය තුළ අවාචික ලක්ෂණ ද පවතියි.
(4) ජනමාධ්‍ය මගින් සමාජ යථාර්ථය නිසි ලෙස පිළිබිඹු වේ.
(5) භාෂාවක ශබ්ද හා අර්ථ අතර තර්කානුකූල සම්බන්ධතාවක් නැත.

**16.** ජනමාධ්‍ය නියාමනයට අයත් වීමේ අවම ඉඩක් ඇත්තේ,
(1) ආචාරධර්ම පද්ධති ස්ථාපනයයි. (2) ලියාපදිංචිකරණ ක්‍රියාවලියයි.
(3) නිසි බලධාරීන් පත් කිරීමයි. (4) අණ-පනත් සම්පාදනයයි.
(5) ස්වයං වාරණයයි.

**17.** නූතන ජනමාධ්‍යවල අවම වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ,
(1) ජනවහර භාවිතයට ගැනීමයි. (2) සංවිධානගත බවින් යුක්ත වීමයි.
(3) වැඩි පෙළඹවීමකින් යුක්ත වීමයි. (4) උත්තේජනය ප්‍රයෝජනයට ගැනීමයි.
(5) පුද්ගල විභින්නතාව හඳුනා ගැනීමයි.

**18.** නිර්මාණාත්මක සන්නිවේදනයට ආවේණික කාර්යයක් **නොවන්නේ,**
(1) දත්ත විශ්ලේෂණයයි. (2) ආනන්දය ළඟා කර දීමයි.
(3) සමාජානුයෝජනය ඇති කරවීමයි. (4) ප්‍රඥාව උපදවීමයි.
(5) දෘෂ්ටිවාද සම්ප්‍රේෂණයයි.

**19.** පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් **නොවන** ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ,
(1) වාචික හා අවාචික ලක්ෂණවලින් යුක්ත වීමයි.
(2) ස්වයං සිද්ධ ලක්ෂණවලින් යුක්ත වීමයි.
(3) වර්ධනීය ලක්ෂණවලින් වියුක්ත වීමයි.
(4) පෙළඹවීම් ක්‍රියාවලියකින් යුක්ත වීමයි.
(5) සහවේදනය හා සම්බන්ධ වීමයි.

**20.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණ දෘශ්‍ය කලාවට අයත් වේ.
(2) ග්‍රැෆික් නිර්මාණ රසවිඳීමට විශේෂ හැකියාවක් අවශ්‍ය වේ.
(3) චිත්‍ර හා ග්‍රැෆික් කලාවන්ට එකම නිර්මාණශීලී න්‍යායයක් අදාළ වේ.
(4) ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණවලට පුහුණු කුසලතා අවශ්‍ය වේ.
(5) චිත්‍ර, ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණ සඳහා විද්‍යුත් තාක්ෂණය සම්බන්ධ වේ.

**21.** ඉන්දියානු හා බංග්ලාදේශ චිත්‍රපට නැරඹූ විචාරකයෙක් 'සංසන්දනය සහ විශ්ලේෂණය' යන මාධ්‍ය විචාර ප්‍රවේශයෙන් ඒවා විචාරයට ලක් කර තිබුණි. එවැනි විචාර හා ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) චිත්‍රපටවල සංකල්ප, ශිල්පක්‍රම හා අන්තර්ගතය තක්සේරු කිරීම
(2) නිර්මාණකරණයේ සදාචාරාත්මක භාවිතය දැක්වීම
(3) චිත්‍රපට නිර්මාණය වූ පසුබිම, කාල වකවානු හා පුද්ගල චරිත විස්තර කිරීම
(4) සමාජය හා සමාජ සබඳතා විවරණය කිරීම
(5) චිත්‍රපට පිළිබඳ ප්‍රේක්ෂක ආකර්ෂණය ඇති වන ආකාරයට විචාරය කිරීම

**22.** පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
A - ස්මාර්ට් ජංගම දුරකථනය (smart phone) යන්ත්‍ර සහායක සමූහ සන්නිවේදන මෙවලමක් ලෙස සැලකිය හැකි වේ.
B - පුරවැසි මාධ්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී බහුලව භාවිත වන සන්නිවේදන මෙවලම ලෙස ජංගම දුරකථනය සැලකිය හැකි ය.
C - දුරකථනය හා පරිගණකය ජනමාධ්‍ය තාක්ෂණය සමග සම්බන්ධ වීම මාධ්‍ය අභිසාරිතාවෙහි ප්‍රධාන සංසිද්ධියකි.

ඉහත ප්‍රකාශ පිළිබඳ දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A පමණක් සත්‍ය වේ.
(2) A හා B පමණක් සත්‍ය වේ.
(3) B හා C පමණක් සත්‍ය වේ.
(4) A, B, C යන සියල්ල සත්‍ය වේ.
(5) A, B, C යන සියල්ල අසත්‍ය වේ.

**23.** ජනශ්‍රැති හැදෑරීම සෑම නිර්මාණකරුවෙකුට ම වැදගත් වන බව විචාරකයෝ පෙන්වා දෙති. එයට හේතුව වන්නේ,
(1) ජනශ්‍රැතිවලින් ජන විඥානය හඳුනාගත හැකි වන නිසා ය.
(2) ජනශ්‍රැති ප්‍රාථමික මූලාශ්‍ර වන නිසා ය.
(3) ජනශ්‍රැති නිර්මාණශීලී වන නිසා ය.
(4) ජනශ්‍රැතිවලින් වස්තු බීජ සොයා ගත හැකි වන නිසා ය.
(5) ජනශ්‍රැතිවල ජනවහර පවතින නිසා ය.

**24.** ගොයම් නෙළීමට ආදේශකයක් ලෙස කොළ මඩින යන්ත්‍රය වේගයෙන් ව්‍යාප්ත වූ නිසා දේශීය ගොවි සංස්කෘතිය තුළ සිදු වූයේ,
(1) පාර සංස්කෘතිකකරණයකි. (Para-culturization)
(2) සංස්කෘතික ත්වරණයකි. (Cultural acceleration)
(3) සංස්කෘතික කම්පනයකි. (Cultural shock)
(4) සංස්කෘතික විසරණයකි. (Cultural diffusion)
(5) සංස්කෘතික ලැග්මකි. (Cultural lag)

**25.** නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අරමුණින් රටක සමාජ මාධ්‍ය වාරණය කරනු ලබන්නේ එම මාධ්‍යයේ සන්දේශ,
(1) ඉතා වේගවත්ව ග්‍රාහකයන් අතර පැතිර යන බැවිනි.
(2) විශ්වසනීයත්වයෙන් ඉහළ මට්ටමක පවතින බැවිනි.
(3) විශ්ලේෂණාත්මක ලෙස කරුණු ඉදිරිපත් වන බැවිනි.
(4) රූප හා හඬ කොටස් අවම ලෙස භාවිත වන බැවිනි.
(5) නිල මූලාශ්‍ර මත පමණක් තොරතුරු ඉදිරිපත් කරන බැවිනි.

**26.** මුද්‍රිත මාධ්‍ය පිළිබඳ පන්ති කාමරයේ පැවති සංවාදයකදී මතු වූ කරුණු මෙසේ ය.
නිමල් :- මුද්‍රිත මාධ්‍යයේ ප්‍රධාන උපකරණය භාෂාවයි.
කමල් :- රූප, වර්ණ සහ සිතුවම් ද ඊට එකතු කළ හැකි ය.
අමල් :- පොත්, සඟරා, පුවත්පත් ආදී වශයෙන් මුද්‍රිත මාධ්‍යයේ විවිධ ස්වරූප පවතී.
රමල් :- සාපේක්ෂව මුද්‍රිත මාධ්‍ය ප්‍රබල සක්‍රීය මාධ්‍යයකි.
විමල් :- මුද්‍රිත මාධ්‍ය බොහෝ විට පොදු භාෂාවක් යොදා ගනී.

මුද්‍රිත මාධ්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) නිමල්, කමල්, අමල් සහ රමල් ය. (2) කමල්, අමල්, රමල් සහ විමල් ය.
(3) නිමල්, කමල්, අමල් සහ විමල් ය. (4) නිමල්, කමල්, රමල් සහ විමල් ය.
(5) නිමල්, කමල්, අමල්, රමල් හා විමල් යන සියලු දෙනාම ය.

**27.** නව ලිබරල්වාදයට අනුව ගෝලීයකරණයේ ව්‍යාප්තියට අනුබල **නොදක්වන** සාධකය වන්නේ,
(1) පාරජාතික සමාගම්කරණයයි. (2) වෙළෙඳපොළ පුළුල්කරණයයි.
(3) නිර්බාධ වෙළෙඳාමයි. (4) ජාතික රාජ්‍ය ශක්තිමත් කිරීමයි.
(5) රාජ්‍යයෙන් ආර්ථිකය නිදහස් කිරීමයි.

**28.** 'ග්‍රාහක කේන්ද්‍රීය සන්දේශකරණය' යනුවෙන් අදහස් කරන්නේ,
(1) ග්‍රාහකයාට සන්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි.
(2) ග්‍රාහකයාට ගැළපෙන ලෙස සන්දේශ සකස් කිරීමයි.
(3) ග්‍රාහකයා වෙත සන්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳව විමසා බැලීමයි.
(4) සන්දේශකරණයේදී සන්නිවේදකයාගේ අනන්‍යතාව නොසලකා හැරීමයි.
(5) ග්‍රාහකයින්ගේ සමාජ, සංස්කෘතික පසුබිම පිළිබඳ අවධානයෙන් තොරව සන්දේශ සකස් කිරීමයි.

**29.** ජනතා බැංකුවේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන්ගේ පෞද්ගලික තොරතුරු, ප්‍රවෘත්ති වෙබ් අඩවියක් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. එමගින් බැංකුවේ ප්‍රතිරූපය බිඳවැටුණු බැවින් කරුණු පැහැදිලි කිරීමේ මාධ්‍ය සාකච්ඡාවක් කැඳවන ලදී. එවැනි අවස්ථාවකදී බැංකුවේ නිලධාරීන් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) පැමිණෙන මාධ්‍යවේදීන්ට හොඳ සංග්‍රහයක් සූදානම් කිරීමටයි.
(2) වටිනා ත්‍යාගයක් මාධ්‍යවේදීන්ට සිහිවටනයක් ලෙස පිරිනැමීමටයි.
(3) බැංකුවේ පැරණි වාර්ෂික වාර්තා පිටපත් මාධ්‍යවේදීන්ට ලබා දීමටයි.
(4) බැංකුව සිදු කරන ලද ප්‍රජා සේවා වැඩසටහන් විස්තර කිරීමටයි.
(5) ඉදිරිපත් විය හැකි ප්‍රශ්නවලට පිළිතුරු සූදානම් කර ගැනීමටයි.

**30.** විකල්ප මාධ්‍ය සම්බන්ධ වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) ජනප්‍රිය සංස්කෘතිය සමග සමීප සබඳතාවක් පවත්වයි.
(2) ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමග තරග කරයි.
(3) සමාජයේ විශාල පිරිසක් වෙත ගමන් කරනු ලබයි.
(4) මතවාදී කාර්යයට ප්‍රමුඛ තැනක් දෙනු ලබයි.
(5) උසස් මාධ්‍ය තාක්ෂණයක් පවත්වාගෙන යනු ලබයි.

**31.** සමකාලීන ජනප්‍රිය සංස්කෘතිය තුළ රූපවාහිනී මාධ්‍ය වඩාත් ම ප්‍රකට කරන ලක්ෂණයක් වන්නේ,
(1) සංස්කෘතිකාංගවල ආකර්ෂණයයි. (2) අල්පේච්ඡතාවයේ වටිනාකමයි.
(3) පරිභෝජනවාදයේ උත්කර්ෂණයයි. (4) බහුභාණ්ඩිකබවෙහි නිස්සාරිත බවයි.
(5) වටිනාකම්වල අනභිභවනීයත්වයයි.


**32.** මහජන සම්බන්ධතාව හා **නොගැළපෙන** අවස්ථාව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) සමාගමක් භාණ්ඩ හා සේවා මිල ගණන් සහිත දැන්වීමක් පළ කිරීම
(2) ආයතනයක් වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීම
(3) පාසලක්, මාසික පුවත් හසුනක් පළ කිරීම
(4) විශ්වවිද්‍යාලයක් එහි 50 වන සංවත්සර ප්‍රදර්ශනය සංවිධානය කිරීම
(5) දේශපාලනඥයෙක් ක්‍රීඩා සංගම්වලට ක්‍රීඩා උපකරණ බෙදා දීම

**33.** පන්ති කාමරයේ පැවති සාකච්ඡාවකදී සිසුන් කිහිපදෙනකු ඉදිරිපත් කරන ලද ප්‍රකාශ පහත දැක්වේ.
නිමල් :- දැන්වීම් කියන්නේ වාණිජ අරමුණින් ඉදිරිපත් වන ප්‍රචාරයක්
විමල් :- මහජන සේවාවක් විදිහට ඉදිරිපත් වන දැන්වීම් දකින්නත් පුළුවන්
කමල් :- දේශපාලන දැන්වීම් මහජනයාට බලපෑම් කරනවා
අමල් :- සාපේක්ෂව දැන්වීම්කරණයෙන් සමාජයට වෙන්නේ යහපතක්
මාධ්‍ය දැන්වීම්කරණයට අදාළ ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,
(1) නිමල් හා විමල් ය. (2) නිමල් හා කමල් ය.
(3) නිමල්, විමල් හා කමල් ය. (4) විමල්, කමල් හා අමල් ය.
(5) නිමල්, විමල්, කමල් හා අමල් යන සියලු දෙනාම ය.

**34.** මුද්‍රිත මාධ්‍යයේ තීරණාත්මක සාධක වන්නේ භාෂාව හා පාඨකයා ය. ඒ අනුව වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) පුවත්පත් වාර්තාකරණයේදී මාධ්‍යවේදියාගේ භාෂා අනන්‍යතාව ප්‍රකට නොවේ.
(2) කවි පොතක් රසවිඳීමේදී සහ පුවත්පතක කවි පිටුවක් රසවිඳීමේදී පාඨකයා සමාන අවධානයක් යොමු කරයි.
(3) ඡායාරූප, චිත්‍ර හා කාටූන් මුද්‍රිත මාධ්‍ය භාෂාවට අයත් නොවේ.
(4) නවකථාවක හා පුවත්පතක කොටස් වශයෙන් පළවන කථාවක පවතින්නේ එක හා සමාන ලක්ෂණයි.
(5) පොත්වලට හා සඟරාවලට පොදු භාෂාව යොදා ගැනීම යෝග්‍ය වේ.

● අංක **35** සිට **38** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිතයට ගන්න.

※ පහත දැක්වෙන්නේ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය යැයි උපකල්පනය කරන්න.




**35.** ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත මූලික අංගවලින් එක් අංගයක් ඉවත් කළ විට එය බර්ලෝ සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත අංග හා සමාන බවක් දක්වයි. එසේ සමාන වීමට ඉහත ආකෘතියේ අංග අතුරෙන් ඉවත් කළ යුත්තේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

**36.** බර්ලෝගේ සන්නිවේදන ආකෘතියේදී එහි අන්තර්ගත එක් එක් මූලිකාංගය හා බැඳුණු ප්‍රධාන ලක්ෂණ පහ බැගින් ඉදිරිපත් කරයි. ඉහත 35 වන ප්‍රශ්නයේ පිළිතුරට අදාළ අංගය ඉවත් කළ පසු ඉතිරි අංග හතර බර්ලෝ සන්නිවේදන ආකෘතිය සමග සැසඳේ නම් එකී අංග හතර අතුරෙන් සමාන ලක්ෂණ දැකිය හැකි අංග දෙක වන්නේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය. (5) C හා E ය.

**37.** ඉහත ආකෘතියට ප්‍රතිපෝෂණය ඇතුළත් කළහොත් එහිදී පණිවිඩය ගමන් කරනුයේ,
(1) B සිට A දක්වා ය. (2) A සිට D දක්වා ය.
(3) D සිට A දක්වා ය. (4) E සිට A දක්වා ය.
(5) A සිට E දක්වා ය.

**38.** ඉහත ආකෘතිය ජනසන්නිවේදන අවස්ථාවක් හා ගැළපීමේදී පුවත්පත අදාළ වන අංගය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

[ හයවැනි පිටුව බලන්න.

**39.** පහත දී ඇති ප්‍රකාශ සැලකිල්ලෙන් කියවන්න.

A - කෙනෙකුගේ චිත්ත ස්වභාවය මතුපිටින් නොව ඇතුළතින් විමසා බැලීම

B - වෙනත් අයෙකුගේ භාවයන් තමන්ට ආරෝපණය කරගෙන එකී පාර්ශ්වය සමග අනන්‍ය වූ සංවේදනයක් ඇති කර ගැනීම

C - සමාජයීය ජීවිතය සාර්ථකව ගත කිරීමට අන්‍යයන්ගේ දුක සැප තේරුම් ගැනීම

ඉහත කී තත්ත්ව වඩාත් අදාළ වන්නේ,

(1) සංජානනයට ය. (2) අන්තර්වර්තී සන්නිවේදනයට ය.
(3) සමාජයීය සහජීවනයට ය. (4) සහානුභූතියට ය.
(5) ධ්‍රැවගත වීමට ය. (Polarization)

**40.** නිදහස් වෙළෙඳපොළ ක්‍රමය සහ මාධ්‍ය සංස්කෘතිය සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) විටෙක වෙළෙඳපොළ ක්‍රමය තුළ සාම්ප්‍රදායික සංස්කෘතිය සැලකිල්ලට ගනු ලබයි.
(2) මාධ්‍ය සංස්කෘතිය සකස් කිරීමට විශේෂඥයින්ගේ පර්යේෂණ නිරන්තරයෙන් භාවිතයට ගැනේ.
(3) සීමිත අවස්ථාවලදී හැර ව්‍යාපාරික ආධිපත්‍යයෙන් බැහැර වීමට මාධ්‍ය සංස්කෘතියට හැකියාවක් නැත.
(4) බොහෝ විට මාධ්‍ය සංස්කෘතිය විසින් එහි ව්‍යාපාරික අපේක්ෂා සඟවනු ලැබේ.
(5) වෙළෙඳපොළ ක්‍රමයට අවශ්‍ය පරිසරය සකස් කිරීම මාධ්‍ය සංස්කෘතිය මගින් සිදු කරයි.

**41.** පහත දැක්වෙන්නේ ස්ව සංකල්පය පිළිබඳ සාකච්ඡාවකදී සිසුන් දැක්වූ ප්‍රකාශ කිහිපයකි.

රුවන් :- ස්ව සංකල්පය යනු යම් පුද්ගලයකු තමන්ව අන් පුද්ගලයන්ට දක්නට සලස්වන ආකාරයයි.
රාම් :- එය මැනීමට නොහැකි ය.
රහීම් :- උප්පත්තියෙන්ම පැමිණෙන්නකි.
රොජර් :- කාලාන්තරයක් තුළ වෙනස් විය හැකි ය.

ස්ව සංකල්පය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,

(1) රහීම් සහ රාම් විසින් වන අතර රුවන් සහ රොජර් නොවේ.
(2) රුවන් සහ රහීම් විසින් වන අතර රාම් සහ රොජර් නොවේ.
(3) රුවන් සහ රොජර් විසින් වන අතර රාම් සහ රහීම් නොවේ.
(4) රාම් සහ රොජර් විසින් වන අතර රුවන් සහ රහීම් නොවේ.
(5) රුවන්, රාම්, රහීම් සහ රොජර් යන සියල්ලන්ම ය.

**42.** ගෝලීයකරණ සන්දර්භය තුළ ජනමාධ්‍යයේ ලක්ෂණයක් **නොවන්නේ**,

(1) එකම පණිවිඩයක් විවිධත්වයෙන් යුත් ග්‍රාහක කණ්ඩායමකට යොමු කිරීම ය.
(2) සාපේක්ෂ වශයෙන් අක්‍රිය පාරිභෝගික කණ්ඩායමක් දක්නට ලැබීම ය.
(3) පොදු අනන්‍යතාවලට වඩා පුද්ගල අනන්‍යතා සඳහා ප්‍රමුඛත්වය හිමිවීම ය.
(4) පවත්නා සමාජ රටාව ස්වාභාවික තත්ත්වයක් බව මහජනයාට පිළිගැනීමට සැලැස්වීම ය.
(5) සමාජයේ බලරහිත වූවන් නිහඬකරවීමේ ප්‍රවණතාවක් පැවතීම ය.

**43.** ගැටුම් විසඳීම සම්බන්ධ විශේෂඥයින් ගැටුම් ආශිර්වාදයක් ලෙස විග්‍රහ කරන්නේ,

(1) ගැටුම් සමාජයට සජීවී බවක් ලබාදෙන බැවිනි.
(2) ගැටුම් සමාජයට ප්‍රවෘත්ති ජනනය කරන බැවිනි.
(3) ගැටුම් සමාජ විපරිවර්තනයට අත්‍යාවශ්‍ය බැවිනි.
(4) ගැටුම් නිසා ඇතැම් පාර්ශ්වවලට වාසි අත් කරගත හැකි බැවිනි.
(5) ගැටුම් මතු වීම සමාජ පාලනය පහසු කරවන බැවිනි.

**44.** අලුත්ම චිත්‍රපටය තිරගත වී නොබෝ දිනකින් එය පිළිබඳ විවිධ ආයතනවල, විවේකාගාරවල සහ ආපනශාලාවල කතාබහ කිරීමට යොමු වීම එහි ජනප්‍රියත්වය වැඩි වීමට බලපෑවේ ය. ඒ අනුව ජනප්‍රියත්වය වැඩි වීමට වඩාත් හේතු වූයේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (2) වාචික සන්නිවේදනයයි.
(3) ජනප්‍රිය සංස්කෘතියයි. (4) අවිධිමත් සන්නිවේදනයයි.
(5) ජනසන්නිවේදනයයි.

**45.** මාධ්‍ය භෞතික සංස්කෘතිය ඇතුළු තාක්ෂණයේ සිදුවන සීඝ්‍ර වර්ධනයට සමගාමීව මාධ්‍ය සාක්ෂරතාව හා කුසලතා වර්ධනය නොවීම සමකාලීන මාධ්‍ය සංස්කෘතිය මුහුණපාන ගැටලුවකි. සංස්කෘතික අධ්‍යයනයෙහිදී මෙය හඳුන්වන්නේ,

(1) සංස්කෘතික පරිහානිය ලෙස ය. (2) සංස්කෘතික විසරණය ලෙස ය.
(3) සංස්කෘතික ත්වරණය ලෙස ය. (4) සංස්කෘතික ලැග්ම ලෙස ය.
(5) සංස්කෘතික විවිධත්වය ලෙස ය.

**46.** ජනමාධ්‍ය සංස්කෘතිය පිරිහීම සම්බන්ධව අදාළ පාර්ශ්ව කටයුතු නොකරන හෙයින් එම තත්ත්වය වැළැක්වීම සඳහා පනතක් ගෙන එන බව රජයේ මාධ්‍ය ප්‍රකාශකයා විසින් පවසන ලදී. මෙහිදී ක්‍රියාත්මක වන්නේ,

(1) සමාජ ප්‍රජාතාන්ත්‍රිකරණ සන්නිවේදන සංකල්පයයි.
(2) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පයයි.
(3) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයයි.
(4) සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පයයි.
(5) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයයි.

**47.** ලොව විවිධ රටවල රජය සහ මාධ්‍ය අතර ඇති සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ පන්තියේදී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් බහුලව දක්නට ලැබෙන තත්ත්වය කුමක් ද?

(1) මාධ්‍ය හිමිකාරිත්වය සහ පාලනය රජයේ ඒකාධිකාරයක් ලෙස පවතී.
(2) මාධ්‍ය හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතු වන අතර පාලනය රජය මගින් සිදු වේ.
(3) මාධ්‍ය හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතු වුවත් රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(4) මාධ්‍ය හිමිකාරිත්වය හා පාලනය යන දෙඅංශයම රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(5) මාධ්‍ය හිමිකාරිත්වය හා පාලනය රජය සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සිදු වේ.

**48.** පහත දැක්වෙන්නේ මාධ්‍ය සංස්කෘතික සංසරණයේ අසමබරතාවට අදාළ ප්‍රකාශ කිහිපයකි.

A - ඒක මාර්ගික ක්‍රියාවලියක් වීම
B - පෙරදිග මතවාද හෙළාදැකීම
C - බටහිර මතවාදවලට ගරු කිරීම
D - වටිනා අංග හුවමාරු කර ගැනීම

මේවා අතුරෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය.
(4) A, B හා C ය. (5) B, C හා D ය.

**49.** ප්‍රාථමික පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් පාසල් සංවර්ධන සමිතිය මගින් ආරම්භ කරන ලදී. එහි කාර්යසාධනය ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක් ඇසුරෙන් විමසා බැලීමට තීරණය විය.

ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක ඇතුළත් විය යුතු මූලික කරුණු කිහිපයක් වන්නේ,

(1) අරමුණු, අයවැය, සංවිධාන ව්‍යුහය හා සීමා ය.
(2) අයවැය, උපායමාර්ග, කාර්යපථය හා අපේක්ෂිත ප්‍රතිඵල ය.
(3) මූල්‍ය සම්පත්, භෞතික සම්පත්, මානව සම්පත් හා ඇගයුම් ක්‍රියාවලිය ය.
(4) අදාළ කාර්යයන්, කාල රාමුව, නිර්ණායක හා වගකීම් ය.
(5) අරමුණු, උපායමාර්ග, සම්පත් හා කාල රාමුව ය.

**50.** මාධ්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මාධ්‍ය සාක්ෂරතාවෙහි පදනම ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි.
B - මාධ්‍ය සාක්ෂරතාව වැඩිපුර අදාළ වන්නේ මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙනි.
C - මාධ්‍ය අන්තර්ගතය තේරුම් ගෙන පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාවයි.
D - සන්දේශ නිර්මාණය හා ඇගයීම මාධ්‍ය සාක්ෂරතාවෙහි අංගයක් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(3) C පමණක් සත්‍ය වේ. (4) A හා B සත්‍ය නමුත් C හා D අසත්‍ය වේ.
(5) A හා B අසත්‍ය නමුත් C හා D සත්‍ය වේ.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

2018.09.01 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **20**කි.

**1.** සන්නිවේදන ක්‍රියාවලිය යනු නියාමනය කරන ලද්දකි.

(i) සමාජය තුළ ක්‍රියාත්මක වන **අවිධිමත්** සන්නිවේදන දාම **දෙකක්** නම් කරන්න.

(ii) පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජනසන්නිවේදනයේ මූලික ලක්ෂණ **හතරක්** සඳහන් කර, ඉන් **දෙකක්** පිළිබඳ සටහන් සපයන්න.

(iv) නිර්වාචික සන්නිවේදනයේ අංග **හතරක්** විස්තර කරන්න.

**2.** නිර්මාණාත්මක චින්තනය නිසා අපූර්වත්වයකින් ලෝකය දකිමින් නව සංවර්ධන ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මිනිසාට හැකි වී තිබේ.

(i) ජනමාධ්‍ය සන්දේශ විග්‍රහ කිරීමේදී අවධානය යොමු කරන 'නිර්මාණශීලී කියවීම' යන්නට අදාළ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ii) ජනජීවිතයේදී ජන ගී වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු **හතරක්** දක්වා, ඉන් **එකක්** ගැන කෙටියෙන් විස්තර කරන්න.

(iii) නිර්මාණාත්මක සංවර්ධන ව්‍යාපෘතියකදී අවසන් වාර්තාවට ඇතුළත් කරන කරුණු **හතරක්** නිදසුන් සහිතව විස්තර කරන්න.

(iv) ඉගෙනුම් මෙවලමක් ලෙස ජනමාධ්‍ය පහත අවස්ථාවන්හිදී යොදා ගත හැකි ආකාරය පිළිබඳ වචන 200 කට නොඅඩු රචනාවක් ලියන්න.

(අ) භාෂාව ඉගෙනීම (වචන 100)

(ආ) සමාජානුයෝජනය (වචන 100)

**3.** (i) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(ii) ජනසන්නිවේදන ක්‍රියාවලියේදී සන්දේශයට සිදුවන හානිය ප්‍රධාන බාධක වර්ග **දෙකට** අදාළව නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) පුවත්පත් කතුවැකිය වැදගත් වන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** සඳහන් කර, ඉන් **දෙකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(iv) සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විවිධ මත ප්‍රකාශ කළ බටහිර විද්වතුන් **හතරදෙනකු** නම් කර, ඉන් දෙදෙනකු සංවර්ධනයට අදාළව ඉදිරිපත් කළ කරුණු **දෙක** බැගින් ගෙන වෙන වෙන ම විස්තර කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**4.** (i) අංකිත මුද්‍රණ ක්‍රමයේ වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) ගෝලීය මාධ්‍යයන්හි සංස්කෘතික සංසරණයේ අසමබරතාව පෙන්නුම් කරන කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) මහජන සම්බන්ධතා කටයුතුවලදී ඡායාරූප භාවිත කළ හැකි ආකාර **හතරක්** දක්වා, ඉන් **දෙකක්** පහදන්න.

(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි **හතරක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

**5.** (i) "සංස්කෘතිය යනු අංග රැසක එකතුවකි." මැලිනොවුස්කි නමැති මානව විද්‍යාඥයාගේ අර්ථකථනයට අනුව සංස්කෘතියක අන්තර්ගත මූලික අංග **හතරක්** නම් කරන්න.

(ii) "සංස්කෘතියක ඇති වන විවිධ වෙනස්කම් සංස්කෘතික කම්පනයට හේතු විය හැකි ය." සංස්කෘතික කම්පනයට බලපාන හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) "ගෘහස්ථ සාමය හා සහජීවනය දේශීය සංස්කෘතියෙහි ඉහළ ඇගයීමකට ලක් වේ." ගෘහස්ථ සාමය හා සහජීවනය නොමැති පවුලක් තුළ දැකිය හැකි සන්නිවේදන ගැටලු **තුනක්** විස්තර කරන්න.

(iv) "ප්‍රධාන සංස්කෘතික ධාරාව හා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය අතර සමීප සබඳතාවක් තිබිය හැකි ය."
ඉහත තත්ත්වයට එරෙහිව ක්‍රියාත්මක වන විකල්ප මාධ්‍ය සතු ලක්ෂණ **හතරක්** විස්තරාත්මකව පහදන්න.

**6.** භාෂාව, මිනිසා විසින් සොයා ගත් විශිෂ්ට උපකරණයකි.

(i) භාෂාව ඇසුරෙන් චිත්ත රූප මැවීමේ හැකියාව හඳුන්වන යෙදුම නම් කරන්න.

(ii) "ජීව භාෂාවක් හඳුනාගැනීමේදී ඊට ආවේණික වූ ලක්ෂණ පවතී." එබඳු ලක්ෂණ **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජනමාධ්‍යයේදී භාෂා භාවිතයේ සීමා දක්නට ලැබේ. පුවත්පත, ගුවන් විදුලිය යන එක් එක් මාධ්‍යයට බලපාන එවැනි සීමා **තුන** බැගින් කෙටියෙන් විස්තර කරන්න.

(iv) නව මාධ්‍ය භාවිතයේ දක්නට ලැබෙන භාෂාමය ප්‍රවණතා **හතරක්** නිදසුන් සහිතව පහදන්න.

**7.** (i) 'සංවර්ධනය' නිර්වචනය කිරීමේදී ඩඩ්ලි සියර්ස් පෙන්වා දුන් කරුණු **හතර** සඳහන් කරන්න.

(ii) සංවර්ධන සන්නිවේදනයේදී සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතයේ ඇති යෝග්‍යතාව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(iii) සිනමා මාධ්‍යය රූපවාහිනී මාධ්‍යයට වඩා වෙනස් වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පහදන්න.

(iv) නිර්මාණකරුවාට මෙන්ම ග්‍රාහකයාට ද මාධ්‍ය විචාරය ප්‍රයෝජනවත් වේ. විචාරය හා සම්බන්ධ, නිර්මාණකරුවාට වැදගත් වන කරුණු **දෙකක්** හා ග්‍රාහකයාට වැදගත් වන කරුණු **දෙකක්** වෙන වෙන ම පැහැදිලි කරන්න.

* * *